සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2022 ජනවාරි

## (304) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

(Corporate & Personal Taxation)

2022-03-20
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 09
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය)**:**

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන **තිසල්,** ඔහුගේ පවුල සමඟ 2018 ජූනි 10 දින ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ අතර, ඔහුගේම ව්‍යාපාරයක් ඕස්ට්‍රේලියාවේ ආරම්භ කළේය. ඔහුගේ ප්‍රධාන ව්‍යාපාරික ගනුදෙනුකරුවන් සිටින්නේ ශ්‍රී ලංකාවේය. එමනිසා ඔහු නිතරම ශ්‍රී ලංකාවට පැමිණෙයි. 2020/21 තක්සේරු වර්ෂය තුළදී, ඔහුගේ ගනුදෙනුකරුවන් සමඟ ව්‍යාපාරික රැස්වීම්වලට සහභාගී වීම සඳහා 2020 ජූලි 05 දින ඔහු ශ්‍රී ලංකාවට පැමිණි අතර, 2020 නොවැම්බර් මස 14 දින ශ්‍රී ලංකාවෙන් නැවත පිටත්ව ගියේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන අනුව, 2020/21 තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ බදු කටයුතු සඳහා **තිසල්ගේ** වාසික තත්ත්වය **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

**සීමාසහිත හැපි සමාගම,** විදේශීය ගැනුම්කරුවන් සඳහා ඇඟළුම් නිෂ්පාදන ව්‍යාපාරයේ නිරතව සිටින වාසික සමාගමකි. එහි විධායක ශ්‍රේණියේ සේවකයන් 100 කට වඩා වැඩි සංඛ්‍යාවක් සිටින අතර, ඔවුන් අතරින් බොහෝ දෙනෙක් ඔවුන්ගේ පාරිශ්‍රමිකයෙන් (remuneration) අත්තිකාරම් පුද්ගල ආදායම් බදු [Advance Personal Income Tax (APIT)] අඩු කිරීමට කැමැත්ත ප්‍රකාශකොට තිබේ. **සීමාසහිත හැපි සමාගම,** සේවකයන්ගෙන් අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) අඩුකරනු ලබන අතර, සියලුම අදාළ සේවකයන් වෙත බදු අඩුකිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අන්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) ක්‍රමය යටතේ, සේවායෝජකයෙකුගේ (employer) වගකීම් තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) අන්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) ක්‍රමය යටතේ, සේවායෝජකයෙක් විසින් නිකුත් කරනු ලබන බදු අඩුකිරීමේ සහතිකයක ඇතුලත් විය යුතු කරුණු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සීමාසහිත ස්ටාර් වීව් හොටෙල් (පෞද්ගලික) සමාගම,** සංචාරක සංවර්ධන පනත යටතේ ලබාගත් බලපත්‍රයක් සහිතව සංචාරක හෝටලයක් පවත්වාගෙන යනු ලබයි. **සීමාසහිත ස්ටාර් වීව් හොටෙල් (පෞද්ගලික) සමාගමේ** 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

| ආදායම් වර්ගය | රු. |
|---|---|
| කාමරවලින් ලද ආදායම | 12,540,000 |
| බීමවලින් ලද ආදායම | 3,450,000 |
| ලාභාංශ ආදායම | 245,800 |
| | **16,235,800** |

**සටහන:** රු.1,140,000/- ක සේවා ගාස්තුවක්, කාමරවලින් ලද ආදායම තුළ ඇතුලත් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා සංචාරක සංවර්ධන බද්ද [Tourism Development Levy (TDL)] **තක්සේරු කරන්න**. (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**සුනිල්** ඔහුගේ පවුල සමඟ මහනුවර වාසය කරයි. 2020/21 තක්සේරු වර්ෂය තුළදී, ප්‍රසිද්ධ ජාතික පාසැලක් ආසන්නයේ පිහිටි අක්කර 2 ක ඉඩමක් රු. මිලියන 200 ක මිලකට මිළදී ගැනීමට එහි හිමිකරු වූ **පෙරේරා** සමඟ ගිවිසුමකට **සුනිල්** එළඹුණු අතර, ඒ සඳහා රු. මිලියන 2 ක නැවත නොගෙවන තැන්පතුවක් ගෙවන ලදී. ගිවිසුමට එළඹුණු විගසම ඔහු විසින් එකක් පර්චස් 10 බැගින් වූ කැබලිවලට ඉඩම වෙන්කරන ලදී. ඉන්පසු බිම් කැබලි 3 ක් **පෙරේරාට** පවරන ලද අතර, ඉතිරිය මාස 2 ක කාලයක් තුළදී වෙනත් පුද්ගලයන්ට විකුණන ලදී. විකුණුම් මුදලින් ඔහු විසින් රු. මිලියන 198 ක් වූ ඉතිරි මුදල **පෙරේරාට** ගෙවන ලදී. මෙම සම්පූර්ණ ගනුදෙනුවෙන් **සුනිල්** රු. මිලියන 6 ක ලාභයක් උපයා ගත්තේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සුනිල්** විසින් උපයන ලද ලාභය බද්දට යටත්වන ආදායමක්දැයි "රාම් ඊශ්වර එදිරිව දේශීය ආදායම් කොමසාරිස් (Ram Ishwara Vs. C.I.R)" නඩුව ඇසුරෙන් **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 30)

### 05 වන ප්‍රශ්නය

**සීමාසහිත නිව් පැෂන්ස් (පෞද්ගලික) සමාගම,** 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2020 අප්‍රේල් 01 දින සංස්ථාපනය කරන ලදි. ප්‍රධාන ගණකාධිකාරිවරයා විසින් පිළියෙල කරන ලද කෙටුම්පත් බදු ගණනය කිරීම අනුව, 2020/21 තක්සේරු වර්ෂය සඳහා බදු අයකළ හැකි ආදායමක් සමාගමට තිබේ. බදු උපදේශකවරයා වශයෙන් සමාගම, ඔබගෙන් උපදෙස් පතයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2020/21 තක්සේරු වර්ෂය සඳහා සමාගම ආදායම් වාර්තාව ඉදිරිපත් කළ යුතුදැයි යන්න ඔබගේ උත්තරයට හේතු සහිතව **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) 2020/21 තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිත දිනය **සඳහන් කරන්න**. (ලකුණු 02)

(c) 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන අනුව, ආදායම් වාර්තාව ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම මත පැනවිය හැකිවන දණ්ඩන **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 06 වන ප්‍රශ්නය

**සීමාසහිත සුනෙර සමාගම,** අත්කම් සුභ පැතුම්පත් සහ වෙනත් තෑගි භාණ්ඩ නිර්මාණය කිරීමේ නිරතව සිටින, එකතු කළ අගය මත බදු [Value Added Tax (VAT)], සඳහා ලියාපදිංචි සමාගමකි. 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුවට අදාල පහත සඳහන් තොරතුරු සමාගමේ පොත්වලින් උපුටාගන්නා ලදි:

(1) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව තුළදී සිදුකරන ලද විකුණුම් පිළිබඳ විස්තර පහත දැක්වේ [එකතු කළ අගය මත බදු (VAT) රහිතව]:

| | රු. |
|---|---|
| අපනයන විකුණුම් | 3,390,000 |
| SVAT ලියාපදිංචි තැනැත්තන්ට කළ දේශීය විකුණුම් | 4,237,500 |
| අනෙකුත් තැනැත්තන්ට කළ දේශීය විකුණුම් | 77,122,500 |

(2) කාර්තුව තුළදී සමාගම පහත සඳහන් යෙදවුම් බදු ගෙවා තිබේ:

| | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය ආනයන මත | 825,000 |
| අමුද්‍රව්‍ය දේශීය ගැනුම් මත | 1,454,000 |
| භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදාගන්නා මෝටර් ලොරියක අළුත්වැඩියා වියදම් මත | 28,540 |

(3) පසුගිය කාර්තුවෙන් ඉදිරියට ගෙන එන ලද අතිරික්ත යෙදවුම් බද්ද (Input VAT) රු.350,000/- කි.

(4) කාර්තුවට අදාල සියලුම සරල කරන ලද එකතු කළ අගය මත බදු [Simplified VAT (SVAT)] බැර වවුචර පත් සමාගම විසින් එකතු කරගෙන තිබුණි.

(5) සමාගම මාසික එකතු කළ අගය මත බදු වාරික වශයෙන් රු.3,000,000/- ක් ගෙවා තිබේ.

(එකතු කළ අගය මත සම්මත බදු අනුපාතය 8% ක් ලෙස සළකන්න.)

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ඉතිරි ගෙවිය යුතු / (වැඩිපුර ගෙවූ) එකතු කළ අගය මත බද්ද **තක්සේරු කරන්න**. (ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

**GS ට්‍රේඩර්ස්, පීටර්** සහ **සොයිසා** විසින් පිළිවෙලින් 1 : 2 අනුපාතයට ලාභ'ලාභ බෙදාගනිමින් පවත්වාගෙන යනු ලබන හවුල් ව්‍යාපාරයකි. ඔවුන්ගේ ව්‍යාපාරය මගින් එළිමහන් ආහාර සැපයීම් සේවාවන් සපයනු ලබයි.

(1) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය පහත දැක්වේ:

| | **රු.** |
|---|---:|
| දළ ලාභය | 12,854,000 |
| ඉඩමක් විකිණීමෙන් ලද ගිණුම්කරණ ලාභය | 4,750,000 |
| ස්ථාවර තැන්පතුවලින් ලද පොලී ආදායම (දළ) | 150,000 |
| | **17,754,000** |
| අඩුකළා: බෙදාහැරීමේ වියදම් | (2,554,000) |
| පරිපාලන වියදම් | (4,580,000) |
| මූල්‍ය වියදම් | (540,000) |
| **හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය** | **10,080,000** |

(2) ඉහත ශුද්ධ ලාභය ගණනය කිරීමේදී පහත සඳහන් වියදම් අඩුකර තිබේ:

- හවුල්කරුවන්ගේ වැටුප්: **පීටර්** - රු.1,600,000/-
  **සොයිසා** - රු.2,400,000/-
- **පීටර්,** හවුල් ව්‍යාපාරයට ණය මුදලක් ලබා දී ඇති අතර, හවුල් ව්‍යාපාරය විසින් ණය මුදල මත ඔහුට ගෙවන ලද ණය පොලිය රු.325,000/- කි.
- හවුල් ව්‍යාපාරයේ පොත් තැබීම වෙනුවෙන් **සොයිසාගේ** දියණියට ගෙවන ලද වැටුප රු.120,000/- කි.

(3) 2016 ජනවාරි 01 දින, රු.4,500,000/- කට මිලට ගත් ඉඩමක්, 2021 පෙබරවාරි 15 දින රු.9,250,000/- කට විකුණන ලදි. මෙම ඉඩම කිසිදු අවස්ථාවක ව්‍යාපාරය සඳහා යොදාගෙන නොතිබූ අතර, 2017 සැප්තැම්බර් 30 දිනට මෙම ඉඩමේ වෙළෙඳපොළ වටිනාකම රු.6,000,000/- ක් විය.

(4) අනෙකුත් සියලු වියදම්, බදු සඳහා ඉඩදෙනු ලබන බව උපකල්පනය කරන්න.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2020/21 තක්සේරු වර්ෂය සඳහා **GS ට්‍රේඩර්ස් හි** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) හවුල් ව්‍යාපාරයේ ව්‍යාපාරික ආදායම. (ලකුණු 04)

(b) හවුල් ව්‍යාපාරයේ බදු අයකළ හැකි ආදායම. (ලකුණු 03)

(c) හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු දළ ආදායම් බද්ද. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත මෙගා (පෞද්ගලික) සමාගම (MPL),** 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ, 2017 අප්‍රේල් 01 දින, සංස්ථාපනය කරන ලද අතර, එය ඉන්දියාවේ සංස්ථාපිත සමාගමක් වන **සීමාසහිත රාවා සමාගමට** සම්පූර්ණ අයිතිය තිබෙන පරිපාලිත සමාගමකි. MPL සමාගම, මෝටර් රථ බැටරි නිෂ්පාදනය කර ඉන්දියාවේ පරිපාලක සමාගම වෙත අපනයනය කරනු ලබයි.

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා MPL හි මූල්‍ය ප්‍රකාශනවලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන තිබේ:

(1) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා MPL හි සාරාංශගත ආදායම් ප්‍රකාශනය පහත දැක්වේ:

| | රු. |
|---|---|
| අපනයන ආදායම | 1,454,200,000 |
| විකුණුම් පිරිවැය | (896,500,000) |
| දළ ලාභය | 557,700,000 |
| වෙනත් ආදායම් | 6,589,400 |
| පරිපාලන හා බෙදාහැරීමේ වියදම් | (403,500,000) |
| මූල්‍ය වියදම් | (5,989,400) |
| **බද්දට පෙර ශුද්ධ ලාභය** | **154,800,000** |

(2) වෙනත් ආදායම් පිළිබඳ විස්තර:

| | රු. |
|---|---|
| ස්ථාවර තැන්පතු මත පොලී ආදායම (දළ) | 1,589,400 |
| මිල ලැයිස්තුගත කොටස් විකිණීමෙන් ලද ලාභය | 5,000,000 |
| | **6,589,400** |

(3) පරිපාලන සහ බෙදාහැරීමේ වියදම් හි පහත දෑ ඇතුළත් වේ:

- වර්ෂය සඳහා ක්ෂය අයකිරීම රු.34,250,000/- කි.
- 2020/21 තක්සේරු වර්ෂය සඳහා පාරිතෝෂික වෙන්කිරීම රු.15,425,000/- ක් විය.
- වර්ෂය තුළදී ඉන්දියාවේ සිට තාක්ෂණික කණ්ඩායමක් පැමිණි අතර, ඔවුන්ගේ සංග්‍රහ වියදම් ලෙස සමාගම රු.1,145,000/- ක් දරණ ලදී.
- 2017/18 තක්සේරු වර්ෂයේදී රු.2,250,000/- ක පිරිවැයකට මිලට ගත් ගෘහභාණ්ඩ 2020 දෙසැම්බර් මාසයේදී රු.265,000/- කට විකුණන ලදී. විකිණීමෙන් වූ ගිණුම්කරණ අලාභය රු.96,000/- කි.
- සමාගම, රු.1,000,000/- ක් රජයේ කොවිඩ්-19 සහන අරමුදලට පරිත්‍යාග කොට ඇත. තවද, රු.500,000/- ක මුදලක් සමාගමේ කොවිඩ්-19 බලපෑමට ලක්වූ සේවකයන් සඳහා පරිත්‍යාග කොට තිබේ.

(4) මූල්‍ය වියදම් හි ඇතුළත් වන්නේ කාලීන ණය සඳහා ගෙවූ රු.5,989,400/- ක පොලිය යි.

(5) 2021 මාර්තු 31 දිනට ස්කන්ධය සහ වගකීම් පිළිබඳ විස්තර පහත දැක්වේ:

| | රු. |
|---|---|
| නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය | 10,000,000 |
| රඳවාගත් ඉපැයීම් | 5,500,000 |
| ගෙවිය යුතු කාලීන ණය | 50,000,000 |

(6) 2021 මාර්තු 31 දිනට පැවති දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර පහත දැක්වේ:

| වත්කම | මිලදී ගත් වර්ෂය | පිරිවැය (රු.) |
|---|---|---|
| ඉඩම | 2017/18 | 86,000,000 |
| ගොඩනැගිලි | 2017/18 | 64,000,000 |
| යන්ත්‍ර | 2017/18 | 48,453,000 |
| යන්ත්‍ර | 2020/21 | 12,500,000 |
| අධ්‍යක්ෂවරයාගේ ගමන් බිමන් සඳහා භාවිත කරන මෝටර් රථය | 2019/20 | 18,450,000 |
| භාණ්ඩ ප්‍රවාහනයට යොදා ගන්නා ලොරි රථ | 2018/19 | 64,120,000 |
| කාර්යාල උපකරණ | 2018/19 | 12,656,000 |
| පරිගණක | 2019/20 | 1,875,000 |
| | | **308,054,000** |

(7) සමාගම, 2020/21 තක්සේරු වර්ෂයේ කාර්තුමය ආදායම් බදු වාරික වශයෙන් රු.10,000,000/- ක් ගෙවා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2020/21 තක්සේරු වර්ෂය සඳහා **සීමාසහිත මෙගා (පෞද්ගලික) සමාගමේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) තක්සේරු කළ හැකි ආදායම,

(b) බදු අයකළ හැකි ආදායම,

(c) ගෙවිය යුතු දළ ආදායම් බද්ද, සහ

(d) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද.

***(සැ.යු: යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුයි.)*** (ලකුණු 25)

## **09** වන ප්‍රශ්නය

වාසික පුද්ගලයෙකු වන **රත්නසිංහ,** මෘදුකාංග ඉංජිනේරුවරයෙකි. ඔහු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ මෘදුකාංග සමාගමක සේවය කරයි.

2020/21 තක්සේරු වර්ෂය (මින්මතු 'වර්ෂය' යැයි හැඳින්වෙන) සඳහා ඔහුගේ ආදායම සම්බන්ධව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

(1) සේවා නියුක්තියෙන් ලද ආදායම:

- දළ වැටුප - මාසයකට රු.375,000/- බැගින්.
- 2020 අප්‍රේල් මාසයේදී ගෙවූ ප්‍රසාද දීමනාව - රු.200,000/- (පෙර වර්ෂයේ ලාභවලින්) වූ අතර, 2020 දෙසැම්බර් මාසයේදී ගෙවූ ප්‍රසාද දීමනාව - රු.100,000/- (වර්තමාන වර්ෂයේ ලාභවලින්) ක් විය.
- සමාගම, ඔහුට මෝටර් රථයක් (1,000 CC) මාසිකව රු.60,000/- ක ඉන්ධන දීමනාවක් ද සමඟ ලබාදී තිබේ.
- සමාගම, වර්ෂය තුළදී ඔහුගේ රු.36,000/- ක ජංගම දුරකතන බිල්පත් ප්‍රතිපූරණය කර තිබේ.
- **රත්නසිංහ,** අත්තිකාරම් පුද්ගල ආදායම් බදු [Advance Personal Income Tax (APIT)] අඩු කිරීම සඳහා ඔහුගේ කැමැත්ත සේවායෝජකයාට ප්‍රකාශකොට නැත.

(2) **රත්නසිංහ,** ඔහුගේ පවුල සමඟ කුළී තට්ටු නිවාසයක ජීවත් වෙයි. ඔහුට, ඔහුගේ පියාගෙන් උරුම වූ බංගලාවක් බණ්ඩාරවෙල තිබේ. ඔහු එය සංචාරක බංගලාවක් ලෙස පවත්වාගෙන යනු ලබන අතර, එහි ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ:

| | **රු.** |
|---|---|
| අමුත්තන්ගෙන් ලද ආදායම | 12,000,000 |
| අඩු කළා: | |
| බංගලාවේ සේවකයන්ට ගෙවූ වැටුප් | 3,480,000 |
| විදුලිය, ජලය සහ දුරකතන වියදම් | 1,721,000 |
| ආරක්ෂක රෙගුලාසි කඩකිරීම නිසා නගර සභාවට ගෙවූ දඩය | 1,000,000 |
| නගර සභාවට එරෙහිව නඩුව සඳහා උපදෙස් ලබාගැනීමට නීතිඥයෙකුට ගෙවූ ගාස්තුව | 500,000 |
| බංගලාවේ නඩත්තු වියදම් | 658,000 |
| **ශුද්ධ ලාභය** | **4,641,000** |

(3) තක්සේරු වර්ෂය තුළදී, පහත සඳහන් පොලී ආදායම් **රත්නසිංහ ට** ලැබී තිබේ:

- රුපියල් ස්ථාවර තැන්පතු මත - රු.84,500/-
- විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (FCBU) ඉතිරිකිරීමේ ගිණුම මත - ඇමරිකානු ඩොලර් ($) 315 [ඇමරිකානු ඩොලර් ($) 1 = රු.200/-]

පොලී ආදායම මත අත්තිකාරම් ආදායම් බදු අඩු කිරීමට ඔහු කැමැත්ත පලකොට නැත.

(4) තක්සේරු වර්ෂය තුළදී පහත සඳහන් ගෙවීම්, **රත්නසිංහ** කර තිබේ:

- වැඩිහිටි පුද්ගලයන්ට ආයතනිකමය රැකවරණය සැපයීම සඳහා පිහිටුවන ලද අනුමත පුණ්‍යායතනයකට රු.100,000/- ක මුදල් පරිත්‍යාගයක්.
- වාර්ෂික වෛද්‍ය රක්ෂණ වාරිකය රු.150,000/- කි.
- ඔහුගේ පුතාගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා පෞද්ගලික විශ්ව විද්‍යාලයකට ගෙවූ ගාස්තුව රු.700,000/- කි.
- පෞද්ගලික රෝහලකදී සැත්කමකට භාජනය වූ ඔහුගේ බිරිඳගේ රෝහල් බිල්පත රු.445,000/- කි.

(5) **රත්නසිංහ,** 2020/21 තක්සේරු වර්ෂය සඳහා කාර්තුමය ආදායම් බදු වාරික ලෙස රු.500,000/- ක් ගෙවා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2020/21 තක්සේරු වර්ෂය සඳහා **රත්නසිංහගේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න:**

(a) බදු අයකළ හැකි ආදායම,

(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද,

(c) ගෙවිය යුතු ඉතිරි / (වැඩිපුර ගෙවූ) ආදායම් බද්ද, සහ

(d) බදු නිදහස් ආදායම, (වේ නම්).

***(සැ.යු:** යම් ආදායමක් බද්දට යටත් නොවේ නම්, ඒ බව පැහැදිලිව සඳහන් කළ යුතුයි.)* (ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අන්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |